# ශ්‍රී ලංකාවේ කුකුලන් ඇති කිරීමේ ව්‍යාපාරය

කෘෂිකර්ම නිලධාරි ඒ. ඒ. ඩයස් විසිනි

වර්ෂ 1959 තෙක් මෙරටට ඉන්දියාවෙන් බිත්තර දස ලක්ෂ 30ක් බැගින් වර්ෂයකට ආනයන කරණ ලදී. මෙහි විදේශීය විනිමය අගය රුපියල් දස ලක්ෂ 4.5 විය. මේ අතරතුර වර්ෂ 1956–1963 දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පෞද්ගලික කුකුලන් ඇතිකිරීමේ ව්‍යාපාරික යින්ගේ බලවත් උත්සාහය නිසාම වර්ෂ 1963 අවසානයේදී බිත්තර පිටරට වලින් ආනයනය කිරීම සම්පූර්ණයෙන් නතර කරන ලදී. වර්ෂ 1963–1967 දක්වා කාලය තුළ බිත්තර නිෂ්පාදන යේ අනුපාතය 6% බැගින් විය. මේ සීඝ්‍රයෙන් වැඩි වූ 6% අනුපාතය නිසා නිෂ්පාදනය ඉල්ලුමට වඩා වැඩිවූ බැවින් බිත්තර වල මිල ක්‍රයෙන් පහත වැටුනි. මෙහි ප්‍රතිඵලය වූයේ කුඩා කුකුල් ව්‍යාපාරිකයින්ගේ ගොවිපලවල් වසා දැමීමය. 6% වර්ධනය කුකුලන් ඇති කිරීමේ ව්‍යාපාරයට අහිතකරවූ නිසා එවකට එය වර්ෂ 1972–1976 දක්වා 5% දක්වා සීමා කිරීමට කටයුතු කෙරෙනි. මෙම සීමා කිරීමේ අදහස වූයේ 1972 වාර්ෂික ඒක පුද්ගල බිත්තර පරිභෝජනය 21.6 වුවත් 1976 වන විට 23.6 දක්වා වැඩි කිරීමටය.

නමුත් අවාසනාවකට මෙන් ඉහත සඳහන් කර ඇති සැලැස්ම සියල්ලම වාගේ බිඳ වැටිනි. මෙයට හේතුව 1973 සිට මෙරට මුණපෑ දරුණු ආහාර හිඟය නිසාය. සත්ව ආහාර නිෂ්පාදනයට අවශ්‍ය වූ ධාන්‍ය ආදිය ජනතාවගේ ප්‍රයෝජනයට ගැනීමට සිදුවිය. මේ නිසා සත්ව ආහාර මිල අධික විය. පහත ඇති සටහනින් එය හොඳින් පැහැදිලි වේ.

| වර්ෂය | ටොන් එකක මිල | බිත්තරයක මිල ගොවිපලේදී | පාරිභෝගිකයාට ලැබෙන බිත්තරයක මිල | |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | ශත | ශත |
| 72 | 440 0 | 0 22 | 0 24 | 0 26 |
| 73 | 540 0 | 0 30 | 0 35 | 0 40 |
| 74 | 780 0 | 0 40 | 0 45 | 0 50 |
| 75 | 1,260 0 | 0 50 | 0 55 | 0 60 |
| 76 | 1,400 0 | 0 55 | 0 60 | 0 65 |

ලංකාවේ දනට කුකුල් ව්‍යාපාරකයින්ට ප්‍රයෝජනයට ගතහැකි ආහාර තොග හා එම තොග මගින් දනට සිටින කුකුලන් සංඛ්‍යාව තක්සේරු කිරීමට පුලුවන.

| කෑම වර්ග | පොල් හා මේද සංයුක්ත මණ්ඩලය ටොන් | බී.සී.සී. මගින් ටොන් | පුද්ගලික වෙළඳුන් මගින් ටොන් | එකතුව |
|---|---|---|---|---|
| කිකිළියන්ගේ ආහාර | 24,500 | 1,200 | 8,600 | 34,300 |
| වැඩෙන සතුන්ගේ ආහාර | 2,920 | 600 | 1,170 | 4,690 |
| පැටව් ආහාර | 1,750 | 300 | 680 | 2,730 |
| | 29,170 | 2,100 | 10,450 | 41,720 |

**ඉහත සටහනේ දක්වා ඇති ආහාර ප්‍රමාණය එක යැපෙන දියුණු කළ වර්ගවල කුකුළන් ප්‍රමාණය මෙසේ යයි තක්සේරු කල හැක.**

| | | | දස ලක්ෂ |
|---|---|---|---|
| **කිකිලියන්** | ... | ... | **.96** |
| වැඩුණු කිකිලියන් | ... | ... | **.18** |
| පැටවුන් | ... | ... | **.26** |

ඉහත දක්වා ඇති සංඛ්‍යාවට මෙරට වර්ගවල කිකිලියන් සංඛ්‍යාව වන දස ලක්ෂ 1–12ද එකතු කල විට මුළු සංඛ්‍යාව දස ලක්ෂ 2.52 වේ.

මෙම කිකිලියන් සංඛ්‍යාවෙන් ලැබෙන බිත්තර ප්‍රමාණය ගෙන වාර්ෂකව ඒක පුද්ගලික පරිභෝජනය ගනන් බලා ඇත.

දැනට මෙරටෙහි නිෂ්පාදනය වන බිත්තර සංඛ්‍යාව

| | | එකකු දමන බිත්තර සංඛ්‍යාව | වාර්ෂික බිත්තර නිෂ්පාදනය | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය |
|---|---|---|---|---|
| (1) ඉහල මට්ටමින් පාලනයවන දියුණු කල වර්ගවල කිකිලියන් දස ලක්ෂ ... | .96 ... | 40 ... | 140.2 ... | 10.8 |
| (2) නොදියුණු මෙරට වර්ගයේ කිකිලියන් දස ලක්ෂ ... ... | 1.12 ... | 15—16 ... | 61.3 ... | 4.7 |
| | 2.08 | 15—16 | 201.5 | 15.5 |

1976 වර්ෂයේදී ඒක පුද්ගලික බිත්තර පරිභෝජනය 23.6ක් බලාපොරොත්තු වූවාද නියම වශයෙන් මෙය 15.5ට වඩා ඉහල නැග නැති බව ඉහත සටහන අනුව පෙනේ. මේ ප්‍රමාණය බලාපොරොත්තු වන 23.6 ප්‍රමාණයට නැංවීමට නම් පහත සඳහන් දෑ ක්‍රියාත්මක කළ යුතුය.

(1) දැනට දියුණු කළ කිකිලියන්ගේ බිත්තර දමන සංඛ්‍යාව 40% සිට 50% දක්වා නැංවීමටත්,

(2) ප්‍රයෝජනයට ගන්නා කුකුල් ආහාරවල පෝෂ්‍ය තත්ත්වය වැඩි කිරීමටත්,

(3) මෙරට කිකිලියන් දෙමුහුන් කොට බිත්තර ලබාගත් සංඛ්‍යාව වැඩි කිරීමටත් කල හැකි දෑ වලින් සමහරකි.

**වෙළඳාම සඳහා නිෂ්පාදනය කරන කුකුල් සාන්ද්‍ර ආහාරවල පෝෂ්‍ය තත්ත්වය වැඩි කිරීම යනුවෙන් අදහස් කරනුයේ එම සාන්ද්‍ර ආහාරයේ අඩංගු ප්‍රෝටීන් වල අගය සහ ප්‍රෝටීන් ප්‍රතිශතය වැඩි කිරීමය. මෙහි ඌණතාවයක් ඇතිවූ කල්හී බිත්තර නිෂපාදනය බෙහෙවින් අඩුවෙයි. මෙහිදී සත්ව ගනයේ ප්‍රෝටීන් විශේෂ තැනක් ගනී. මාළු කුඩු වල අධික ප්‍රමාණයක් ලුණු හා මේද අඩංගු වන්නේ නම් මෙය සලාකයට එකතු කිරීමෙන් සතුන්ට හානි ගෙන දේ. තවද සමහරකුට වෙළඳුන් විසින් හාල් නිවුඩු වෙනුවට වී පොතු අඹරා සළාකයට එකතු කරයි. මෙයින් සලාකයේ පෝෂ්‍ය මට්ටම අඩු වෙයි. මෙම නිසා කුකුල් ආහාරයක් මිළදී ගත යුත්තේ රජය අනුමත කළ විශ්වාස දයක වෙළඳුන්ගෙන් සහ වෙළඳ සමාගම් වලිනි.**